විශිෂ්ටයන්ගේ අතිවිශිෂ්ටයන් බිහිකරන පාඩම් මාලාව **11**

බුද්ධි කලම්බනයක නවමු මඟ

ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත තරග විභාගය

මෙම පාඩම් මාලාව පහත සඳහන් විෂයයන් හතරම ආවරණය කරනු ලබයි. සාමාන්‍ය බුද්ධිය, සාමාන්‍ය දැනීම, රචනය හා සාරාංශය, කළමනාකරණ අභියෝගතාවය, මෙම විෂයයන් ප්‍රශ්න පත්‍ර හතරක් ලෙසින් පහත පරිදි විභාගයට ලැබේ.
සාමාන්‍ය බුද්ධිය කාලය පැය 1 යි - බහුවරණ ප්‍රශ්න 50 යි ලකුණු 100යි
සාමාන්‍ය දැනීම කාලය පැය 2යි බහුවරණ 50 යි, ව්‍යුහගත 25 යි ලකුණු 100යි
රචනය හා සාරාංශය කාලය පැය 2 යි රචනය වචන 200කි,සාරාංශයක් ලැබූ ලකුණු 100යි.
කළමනාකරණ අභියෝගතාවය කාලය පැය 2 යි බහුවරණ 50යි ව්‍යුහගත 25 යි ලකුණු 100 යි.

සාමාන්‍ය දැනීම - 07

01. ලොව වැඩිම විශාලත්වයකින් යුත් දූපත් හතරකි.

1. විශාලත්වය අතින් ලොව පළමු තැන හිමිවන දූපත - ග්‍රීන්ලන්තයයි. එහි විශාලත්වය වර්ග කිලෝමීටර් 21,30,800 කි.

2. නිව්ගිනියා - විශාලත්වය අතින් දෙවන ස්ථානය හිමිකරගන්නා දූපතයි. එහි විශාලත්වය වර්ග කිලෝමීටර් 8,00,000

3. බෝර්නියෝ දූපත - විශාලත්වය අතින් තෙවන තැන හිමිකර ගන්නා අතර එහි විශාලත්වය වනුයේ වර්ග කිලෝමීටර් 7,25,500 කි.

4. විශාලත්වය අතින් ලොව සිවුවෙනි තැන හිමිවනුයේ මැඩගස්කර් දූපතටයි. එහි විශාලත්වය වර්ග කිලෝමීටර් 5,78,041 කි.

02. ලොව වියළිම ප්‍රදේශ

ලොව යම් ප්‍රදේශයක වියළි හෝ තෙත් බව මනිනුයේ එම ප්‍රදේශයට වැටෙන වාර්ෂික වර්ෂාපතනය සැලකිල්ලට ගනිමිනි. වසරකට අඟල් 1 කට වඩා අඩුවෙන් වැසි ලැබෙන ප්‍රදේශ බොහොමයක් ලොව තිබේ.

මේ ලොව මිනිසා ජීවත්වන වඩාත් වියළිම ප්‍රදේශ හතර පිළිබඳ තොරතුරුය.

1. මිනිස් වාසයක් සහිත ලොව වඩාත්ම වියළි ප්‍රදේශය ලෙස සැලකෙන්නේ ඊජිප්තුවේ අස්වාන් ප්‍රදේශයයි. එහි වාර්ෂික වර්ෂාපතනය අඟල් 0.02 කි.

2. ඊජිප්තුවේ ම පිහිටි ලුක්සෝර් ප්‍රදේශය මෙම වර්ගීකරණය අතින් දෙවන ස්ථානය හිමිකර ගනියි. එහි වාර්ෂික වර්ෂාපතනය අඟල් 0.03 කි.

3. මිනිසුන් සහිත වඩාත් වියළි ප්‍රදේශ අතරින් තෙවැනි තැන චිලී දේශයේ අරිකා ප්‍රදේශයයි. එහි වාර්ෂික වර්ෂාපතනය අඟල් 0.04 කි.

4. හතරවන ස්ථානය පීරූ දේශයේ ඉකා ප්‍රදේශයයි. එහි වාර්ෂික වර්ෂාපතනය අඟල් 0.1 කි.

03. බිස්මාර්ක් නෞකාව අනතුරට පත් වූ වර්ෂය - 1941 මැයි 27 මුහුදු ප්‍රදේශය (අනතුරට පත්) - උතුරු අත්ලාන්තික් මුහුද

අයත් රට - ජර්මානු යුද නැවකි.

04. ලොව ගුවන් තොටුපළවල් වැඩිම සංඛ්‍යාවක් පිහිටි රට - ඇමෙරිකාව. එහි විවිධ ප්‍රමාණයේ ගුවන් තොටුපළවල් 15,000 ක් පමණ පිහිටා තිබේ.

05. සැම්බියාවේ භාවිත මුදල් වර්ගය - සැම්බියානු ක්වාචා

06. අශ්වබල 1 ක් යනු? රාත්තල් 33,000 ක් අඩි 1 ක් ඉහළට විනාඩියක් ඔසවාගෙන සිටීම අශ්ව බල 1 කට සමාන වේ. (අශ්ව බල 1 = රාත්තල් අඩි 33,000 විනාඩි 1)

07. ලොව අඩුම ජනගහනයක් සහිත රට - වතිකානුවයි. එහි ජනගහනය 800 කි.

08. හොන්ඩුරාස් හි මුදල් ඒකකය - ඉම්පයිරාස්

09. ගිවන්ටනාමෝ සිරකඳවුර පිහිටි රට - කියුබාව

10. මෑතකදී වඳවී ගිය භාෂා

1. අක්කලා සාමි - 2003
2. අනකාහා - (20 වන සියවසේ මුල)
3. අත්සුගෙවි - (1988)
4. අදයි - (19 වන සියවසේ අග)
5. අපලාචි - (18 වන සියවසේ මුල)
6. අරුවා - (1877)
7. ආර්චි - (19 වන සියවසේ මුල)
8. ඇල්සියස් භාෂා පවුල - ඇල්ෂියා (1942)
9. යතිකා - (1884)
10. කයු සේ - (1930 දශකයේ)
11. කිකොමු කෙල්ටෙක් - (20 වන සියවස අග)

11. බර සහ සැහැල්ලුම මූලද්‍රව්‍ය

1. බරම මූලද්‍රව්‍යය - ඔස්මියම්

(ඝන සෙන්ටිමීටරයක් ග්‍රෑම් - 22.61 බර වේ) මෙම මූලද්‍රව්‍ය සොයා ගනු ලැබුවේ - 1803 බ්‍රිතාන්‍ය රසායන විද්‍යාඥයකු වූ ස්මිත්සන් ටෙන්නට් ය.

2. ඊලෑටිනම් - මෙය ඝන සෙන්ටිමීටරයක් ග්‍රෑම් - 21.15 ක් බරය.

වාහනවලින් පිටවන දුමාරය නිසා සිදුවන පරිසර හානිය අවම කර ගැනීමට වාහනවල උත්ප්‍රේරක පරිවර්තකයන්ට ද යොදනු ලැබේ.

3. ඊලූටෝනියම් - සොයාගනු ලැබුවේ 1941 වසරේදීය. බරින් වැඩිවන ඉතාම විකිරණශීලී ලෝහයකි.

4. රත්තරන් - ඝන සෙන්ටිමීටරයක බර ග්‍රෑම් 19.29

බර අඩුම මූලද්‍රව්‍යය

1. හයිඩ්‍රජන් - මෙය මූලද්‍රව්‍ය අතර සරලම, සැහැල්ලුම මූලද්‍රව්‍යයි. විශ්වයේ ඇති පරමාණුවලින් 93% ඇත්තේ හයිඩ්‍රජන් පරමාණුවය. වාතය ලීටර් මිලියන 100 කට ඇත්තේ හයිඩ්‍රජන් ලීටර් 5 ක් පමණි.

2. හීලියම් - හයිඩ්‍රජන් මෙන් දෙගුණයක් බරය. හීලියම් හයිඩ්‍රජන් මෙන් දහනය නොවන නිසා නවීන ගුවන් නැව් සඳහා හීලියම් භාවිත කරයි.

3. ලිතියම් - 1817 දී ස්විඩන් ජාතික විද්‍යාඥයෙකු වූ ජොහැන් ඔගස්ට් ආෆ්වෙඩ්සන් සොයා ගත්හ. මෙය ජලය මෙන් හරි අඩක් බරය.

4. පොටෑසියම් සහ සෝඩියම් - මෙම මූලද්‍රව්‍ය දෙකම සොයාගනු ලැබුවේ 1807 හම්ප්‍රිඩේවි විසිනි. ජලයට වඩා බරින් අඩු ලෝහ වේ.

12. ගිනස් වාර්තා පොත බිහිවූයේ කිනම් වසරකදී ද? 1955 දීය.

13. ඒන්ජල් සහ සල්ටෝ ඒන්ජල් යනු එකම දිය ඇල්ලට භාවිත නමකි.

14. ලොව මුල්ම ගුවන් අනතුර සිදුවූයේ - ගුවන් යානය සොයාගත් රයිට් සහෝදරයන්ගෙන් ඕවිල් රයිට් 1908 සැප්තැම්බර් 17 ඇමෙරිකාවේ දී හමුදා ලුතිනන් සෙල්ෆ්රිජ් ද නංවාගෙන ප්‍රදර්ශන ගමනක යෙදී සිටිය දී යානය කඩා වැටී ලුතිනන්වරයා මරුමුවට පත් විය.

15. වියෑං කායි ෂෙක් ජාත්‍යන්තර ගුවන් තොටුපළ පිහිටි රට - තායිවානයේ තායි පෙයි නගරයේයි.

16. CDG යනු ප්‍රංශයේ චාල්ස් ඩිගෝල් ජාත්‍යන්තර ගුවන් තොටුපළ හඳුන්වන සංකේත නාමයයි.

17. යුරෝපා කොමිසමේ සභාපතිවරයා කවුද? ජොසෙ මැනුවෙල් බැරොසො

18. ලොව විශාලතම උද්‍යාන

1. ජනතාව පැමිණීම අතින් ලොව පළමු තැන හිමිකර ගන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරිඩා හි පිහිටි වර්ල්ඩ් ඩිස්නි වර්ල්ඩ් රෙසෝට් හි මැජික් කිංඩම් විනෝද උද්‍යානයයි.

2. දෙවන ස්ථානය - ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා හි පිහිටි ඩිස්නිලන්තයයි.

3. තෙවන ස්ථානය - ජපානයේ ටෝකියෝ හි පිහිටි ටෝකියෝ ඩිස්නිලන්තය වේ.

4. සිවුවන ස්ථානය - ප්‍රංශයේ මාර්සේ - ල - වලී පිහිටි පැරිස් ඩිස්නිලන්තය වේ.

1. A (H1 N1) නව ඉන්ෆ්ලුවෙන්සා වෛරසය ලංකාවට මෙන්ම ලෝකයට ද විශාල තර්ජනයක් වී ඇත. මෙය වැලඳුණු පිරිස් 1000 පමණ ඇතැයි සෞඛ්‍ය බලධාරීන් සැක කරයි. මෙය සූකර උණ රෝගය ලෙස නම් ලැබූයේ වෛරසයේ ජානමය සංයුතිය ඌරන් හට වැලඳෙන ඉන්ෆ්ලුවෙන්සා රෝග කාරක වෛරසයේ කුරුළු හා මිනිස් ජාන මෙන්ම යුරෝපා ආසියානු සූකර ජාන යන ජාන වර්ග 4 ම අඩංගු වීම නිසාය. මෙය කැස්සෙන් හා කිවිසීමෙන් සම්ප්‍රේෂණය වේ. ඌරන් හා බෝවීම අතර සම්බන්ධයක් නැත.

2. ස්විට්සර්ලන්තයේ සූරිච් නුවරදී (20 - 22) දෙමළ හා මුස්ලිම් පක්ෂ සාකච්ඡා පැවැත්විය. සුළු ජාතීන්ගේ අයිතීන් රැකගැනීම සම්බන්ධව සාකච්ඡා විය. මෙය ලංකා ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයකි.

3. 1934 මැයි 9 දින මෙරට ප්‍රථම ගුවන් තොටුපළ වූ රත්මලාන ගුවන් තොටුපළ ඉදිකිරීම ආරම්භ විය. 1935 මෙරට ගුවන් සේවය ඇරඹීය. කැනඩා රාජ්‍යයේ ආධාරයෙන් කටුනායක ගුවන් තොටුපළ ඉදිකළේය.

ගුවන් යානා සඳහා අනන්‍ය වූ ලියාපදිංචි අංකයක් පවතින අතර ලංකාවේ එය 4R නමින් හැඳින්වේ. අනන්‍ය වූ නාම ද පවතින අතර බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හඳුන්වනුයේ VCBI ලෙසයි.

4. සුසන්තිකාට හිමි වන රිදී පදක්කම ජනවාරි මස ජනපති අතින් ලබා දීමට කටයුතු සලසා ඇත. තහනම් උත්තේජක ගැනීම හේතුකොට මේරියන්ස් ජෝන්ස්ට රන් පදක්කම අහිමි විය.

5. සිම්බාබ්වේ ජනපති මුගාබේ 85 වන ජන්ම දිනය සැමරීය.

6. ප්‍රථම ආසියානු බීච් වොලිබෝල් තරගය චීනයේ හයිනෑන් දූපතේ පැවැත්වේ. ඊට ලංකාවේ කාන්තා සහ පිරිමි කණ්ඩායම් 2 බැගින් 4 ක් ඉදිරිපත් වේ.

7. ජපාන පාර්ලිමේන්තු සෙනට් සභිකයන් වන අරායි සහ මුත්සුෂිකා ජනපති පසුගියද හමු විය.

8. දේශගුණික විපර්යාස පිළිබඳ සමුළුවේ එළැඹීමට බලාපොරොත්තු වන තීරණ පහත පරිදි වේ.

i. හරිතාගාර වායු විමෝචනය සීමා කිරීම.
ii. දේශගුණික විපර්යාසයන්ට ලක්වන රාජ්‍යයන්ට අරමුදල් දීම.
iii. 2012 දේශගුණික සම්මුතියක් ඇතිකර ගැනීම.

2020 වන විට 40% වායු විමෝචනය අඩු කළ යුතුයි. චීනය/ ඉන්දියාව/ බ්‍රසීලය වායු විමෝචනය වැඩි වන බව පරිසරවේදීන්ගේ මතයයි.

9. ඉතාලි අගමැති සිල්වියෝ බර්ලුස්කෝනි හට තොබෝද වාටැග්ලියා නම් පුද්ගලයාගේ ප්‍රහාර එල්ල වීම හේතුකොට දේශගුණික විපර්යාස පිළිබඳ සමුළුවට ද සහභාගී වීමට නොහැකි විය.

10. ඇමරිකානු කෙවින් ජොන්සන් පරදා හෙවිවේට් බොක්සිං කිරුළ යුක්රේනයේ විටාලි ක්ලිට්ස්චිකෝ දිනාගන්නා ලදී.

11. M. J. M. ලාෆිර් කුසලාන බිලියඩ් සූරයා ලෙස K. H. සිරිසෝම ද ස්නූකර් සූරයා ලෙස සුසන්ත බොතේජු ද පත් විය.

12. මීළඟ ලෝක කුසලාන ක්‍රිකට් තරගය පල්ලෙකැලේ සහ හම්බන්තොට ක්‍රීඩාංගණයන්හි පැවැත්වීමට කටයුතු යොදයි. 2011 දී එය පැවැත්වීමට කටයුතු යොදයි.

13. දකුණු ආසියානු පාපන්දු වැඩිම ගෝල් ලාභියා හා වේගවත්ම ගෝල වාර්තා කළ අය ලෙස ඊ. බී. චන්න සම්මාන දිනාගන්නා ලදී.

14. දිනමිණ සිය 100 වන උපන් දිනය දෙසැ. 17 සැමරීය. 1909 දෙසැ. 17 එය H. S. පෙරේරා විසින් ආරම්භ කරන ලදී.

15. සන්ජීල් 2 නම් මිසයිලයක් ඉරානය අත්හදා බැලීය.

16. කියුබාවේ පැවතුණු ගුඅන්තනාමෝ සිර කඳවුර ඇමරිකාවේ ඉලිනොයිස් හි තොම්සන් කාරෙක්ෂතල මධ්‍යස්ථානය වෙත ගෙන යන ලදී.

17. මාතර කොරියානු මිත්‍රත්ව රෝහලක් ඉදිවෙමින් පවතී. මෙය දකුණු පළාතේ විශාලතම රෝහලයි.

මීළඟ පාඩම සඳුදා (03) පත්‍රයේ පලවේ

ඉදිරිපත් කිරීම
අනුෂා ගෝකුළ ප්‍රනාන්දු
අධ්‍යක්ෂ
බස්නාහිර පළාත්
සමාජ සේවා දෙපාර්තමේන්තුව

දිනමිණ පුවත්පත ඔබට ලබා ගැනීමේ අපහසුතා ඇත්නම් පුවත්පත් බෙදා හැරීමේ කළමනාකරු, 011 2429371, දුරකථන අංකයට හෝ 011 2429378 සහ 011 2429776 යන දුරකථන අංකයන්ට අමතා හෝ 011 2429470 යන Fax අංකයට දන්වා විස්තර ලබා ගන්න.

© 2010

converted by Web2PDFConvert.com